**උ.ප.රා.සේ.කො.ස චක්‍රලේඛ අංක:.25/2026**

මගේ අංකය:NP/07/10/04/99
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
2026.08.25

අමාත්‍යාංශ ලේකම්වරුන්, උතුරු පළාත
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, උතුරු පළාත
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**උතුරු පළාත් තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන්**
**විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය - 2024 (2026)**

2016.01.12 වැනි දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද 2013.06.01 දින සිට බලපැවැත්වෙන උතුරු පළාත් තාක්ෂණ සේවයට අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව උතුරු පළාත් තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය ශ්‍රී ලංකා විභාග කොමසාරිස් ජනරාල් විසින් **2026 ඔක්තෝබර් මාසයේ දී කොළඹ දී** පවත්වනු ලැබේ.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ " Our Services " යටතේ ඇති "Online Applications - Recruitment Exam / E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර, අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026.08.25 දින පෙ.ව. 9.00** ට **විවෘත වන අතර 2026.09.04 දින ප.ව.9.00** ට **අවසන් වේ.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ එකඟතාවය සහ උපදෙස් පරිදි, අයදුම්පත අන්තර්ජාලය ඔස්සේ ඉදිරිපත් කිරීමෙන් පසු, අපේක්ෂකයා විසින් එය බාගත කර මුද්‍රණය (Print) කරගත යුතු අතර, අදාළ කොටස් තමන්ගේම අත් අකුරින් පුරවා, අත්සන් තබා, තමන්ට අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා ලවා සහතික කරවා ගත යුතුය. නිලධාරීන් විසින් මෙම ලේඛනය තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හරහා , **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට **2026.09.03** දින හෝ ඊට පෙර ලැබෙන ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතුය.

**02. 2024.12.31 දින හෝ ඊට පෙර පහත සුදුසුකම් සපුරාලන නිලධාරීන්ට මෙම චක්‍රලේඛයේ සඳහන් විභාගය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.**

(i) උතුරු පළාත් තාක්ෂණ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර **පහක (05)** සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නියමිත වැටුප් වර්ධක **පහම (05)** උපයාගෙන ඇති;

**සහ**

(ii) උසස්වීම් ලබන දිනයට පූර්වාසන්න වසර **පහක (05)** සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති;

**සහ**

(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 1/2020 හි සඳහන් විධිවිධානයන්ට විනයානුකූල දඬුවමක් ලබා නොමැති;

**සහ**

(iv) තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී ඇති, නිලධරයන් **මෙම විභාගය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.**

**03.** පහත දැක්වෙන වැටුප් පරිමාණය විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වලංගු වේ.

**(MN - 7 - 2025 4 පියවර) රු.75,320 - 8 x 1,360 - 18x1,850 - රු. 119,500**

**04.** උතුරු පළාත් තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ ක්‍රමය පහත පරිදි වේ:-

**(i) බඳවා ගන්නා ප්‍රතිශතයන්:**

| | |
|---|---|
| **සීමිත** | **40%** |
| **සේවා පළපුරුද්ද හා කුසලතා** | **60%** |

(ii) අනුමත තනතුරු සංඛ්‍යාව **04** ක් වන විට සීමිත තරඟ විභාගය මගින් බඳවාගනු ලබන ප්‍රතිශතය 25% හා සේවා පළපුරුද්ද හා කුසලතාව යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 75% විය යුතු අතර, අනුමත තනතුරු සංඛ්‍යාව **03** ක් වන විට ඉහත සීමිත තරඟ විභාගය යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 33.33% හා සේවා පළපුරුද්ද හා කුසලතාව යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 66.66% විය යුතුය.

(iii) උතුරු පළාත් තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු සංඛ්‍යාව **04** කට වැඩි නම්, ඉහත ඡේද අංක **04 (i)** හි සඳහන් ප්‍රතිශතයන්ට යටත්ව සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත පුරප්පාඩු පිරවීම සිදු කළ යුතුය.

(iv) **උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්** වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින පවත්වනු ලබන විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත ඉන් සමත් වන්නන් අදාළ සෙසු අවශ්‍යතා ද සම්පූර්ණ කර ඇති බවට **උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව** විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයක් මගින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව විභාගයේ කුසලතා අනුපිළිවෙළ මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විභාග පැවැත් වූ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම **උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව** විසින් සිදු කරනු ලබයි.

(v) මෙම විභාගයේ ප්‍රතිඵල 2024.12.31 දින වන විට පවතින පුරප්පාඩු පිරවීම සඳහා යොදාගනු ලබන අතර, අදාළ සුදුසුකම් සපුරාලන නිලධාරීන් අතරින් විභාගයේ දී ලබාගත් ලකුණු මත තීරණය කෙරෙන කුසලතා අනුපිළිවෙල අනුව අපේක්ෂකයින් තෝරාගනු ලබන අතර, විභාගය පැවැත්වූ දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියේ තනතුරට පත් කිරීම සඳහා සලකා බලනු ඇත.

(vi) විශේෂ ශ්‍රේණියේ තනතුරට උසස්වීම් ලබා දීම සඳහා වන මෙම සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල, 2024 වර්ෂයේදී ඇති වූ පුරප්පාඩු පිරවීම සඳහා පමණක් අදාළ වේ.

(vii) මෙම විභාගයේ ප්‍රතිඵල මත උතුරු පළාත් තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ 2024.01.01 සිට 2024.12.31 දක්වා එක් එක් දෙපාර්තමේන්තුවල සහ අමාත්‍යාංශවල ඒ ඒ තනතුරේ පුරප්පාඩු පුරවනු ලැබේ.

**05. අයදුම්කරුගේ අනන්‍යතාව තහවුරු කිරීම**

(i) අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමකට පත්විය හැකිවන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලේඛනවලින් කුමන හෝ එකක් පිළිගනු ලැබේ.

(අ). ජාතික හැඳුනුම්පත

(ආ). වලංගු ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය

(ඇ). වලංගු ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රය

(ii) තවද, අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගත හැකි පරිදි මුහුණ සහ ඉලෙක්ට්‍රෝනික උපාංග පැළඳ නොසිටින බව තහවුරු කරගැනීම සඳහා කන් දෙකම ආවරණය නොකර විභාග ශාලාවට ඇතුළු විය යුතුය. තවද, එසේ තහවුරු කරගැනීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කරනු නොලැබේ. තවද, විභාග ශාලාවට ඇතුළත්වූ මොහොතේ සිට විභාගය අවසන් වී විභාග ශාලාවෙන් පිටත්ව යන තුරු අයදුම්කරුගේ අනන්‍යතාවය තහවුරු වන ආකාරයෙන් මුහුණ සහ කන් දෙක ආවරණය නොකර සිටිය යුතුය.

**06. අයදුම්කිරීමේ පිළිවෙල**

(i) මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගත්ව යොමු කරන ලද මෘදු පිටපත් වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට පුවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගැනීම අවසන් වන පැයට මාර්ගගත පද්ධතියේ සඳහන් තොරතුරු නිවැරදි සේ සලකා ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.

(ii) අයදුම්කරුවන්ට තම අයදුම්පතේ සඳහන් කළ භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට **ඉඩදෙනු නොලැබේ**. මෙම විභාගය සඳහා අයදුම්කරුවන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය තුනෙන්ම විභාගය පවත්වනු ලබන අතර, අයදුම්කරුවන් විසින් තමා පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂා මාධ්‍යයකින් පිළිතුරු සැපයිය යුතු වේ.

(iii) විභාග ගාස්තුව රු.600/-කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

- ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
- අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ් පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
- ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය / Flex යෙදවුම (Online Banking Method / Flex App of Bank of Ceylon)
- ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of Bank of Ceylon)
- තැපැල් දෙපාර්තමේන්තුවේ ඕනෑම තැපැල් කාර්යාලයක් මගින් (Any Post Office of the Postal Department)

සටහන:-

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

**07.** (i) මෙම චක්‍රලේඛ නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ කුවිතාන්සිය සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, අන්තර්ග්‍රහණය කර ඇති රාජ්‍ය සේවය, අයදුම්කරුගේ අත්සන සහ අත්සන සහතික කිරීම, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය හා සහතිකය සහිතව තම අයදුම්පත් නිවැරදිව සම්පූර්ණ කර ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් සඳහා විභාග ප්‍රවේශ පත්‍රය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබේ. විභාගයට පෙනී සිටින නිලධාරීන්, තමන්ගේ අත්සන තහවුරු කරන ලද ප්‍රවේශ පත්‍රය විභාග අධීක්ෂකවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම හේතුවෙන් අපේක්ෂකයාට විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත. තවද, අපේක්ෂකයෙකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, එම අපේක්ෂකයා විසින් අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා ඇති බවට වන සාධකයක් ලෙස නොසැලකිය යුතුය.

(ii) විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. එම නිවේදනය පළ කර දින 2 කට හෝ 3 කට පසුව තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව **" ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් "** විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචි අයෙකු නම් ඉහත විස්තර සමග ෆැක්ස් මාර්ගයෙන් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගත හැකි ආකාරයෙන් අයදුම්කරුගේ ෆැක්ස් අංකය සඳහන් කර ඉල්ලීම් ලිපියක් නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකයට යොමු කර විමසා සිටීම ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක්, විභාග ගාස්තු ගෙවා ලබාගත් කුවිතාන්සියේ පිටපතක් හෝ අයදුම්පත්‍රය තැපැල් මගින් යොමු කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) අයදුම්පත්‍රයේ සහ විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයකු ලවා සහතික කර තිබිය යුතුය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර විභාග දිනයේ දී තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත භාරදිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

**08.** ඉහත **(07)** වැනි **ඡේදයේ** සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අයදුම්කරුවන් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියවිලි සලකා බලනු නොලැබේ.

## 09. විභාග ප්‍රතිඵල නිකුත් කිරීම

මෙම විභාගයේ ප්‍රතිඵල රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියේ පළකිරීමට කටයුතු කරනු ලැබේ.

## 10. විභාග පරිපාටිය

මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පැවැත්වේ. තවද ඉල්ලුම්කරන ලද භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

(i) I ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

| | | | |
|---|---|---|---|
| (1) | අභියෝග්‍යතා පරීක්ෂණය | - කාලය පැය 1 කි. | ලකුණු 100 |
| (2) | කළමනාකරණය | - කාලය පැය 3 කි. | ලකුණු 100 |

සුදුසුකම් ලැබීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතු වේ.

**පළමු වන ප්‍රශ්න පත්‍රය සඳහා විෂය නිර්දේශය පහත දැක්වේ.**

<u>අභියෝග්‍යතා පරීක්ෂණය - විෂයය අංකය (1)</u>

තමා වෙත පැවරෙන කාර්යයන් සාමාන්‍ය කාර්යසාධන මට්ටම ඉක්ම වූ කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටුකිරීම සඳහා අවශ්‍යවන දැනුම, කුසලතා හා ආකල්ප අත්පත් කරගෙන තිබේ ද යන්න හා ඒවා භාවිතයේ දී ඉහළ ප්‍රවීණතාවක් දක්වන්නේ ද යන්න මැන බැලීමේ පරීක්ෂණයකි. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

**දෙවැනි ප්‍රශ්න පත්‍රය සඳහා විෂය නිර්දේශය පහත දැක්වේ.**

<u>කළමනාකරණය - විෂයය අංකය (2)</u>

(i) කළමනාකරණ මූලධර්ම

(ii) කළමනාකරණ ශ්‍රිත

සැලසුම් කිරීම
තීරණ ගැනීම
තීරණ ගැනීමේ ක්‍රියාවලිය
සංවිධානය
මාණ්ඩලිකරණය
මෙහෙයවීම
අභිප්‍රේරණ ක්‍රියාවලිය
නායකත්වය
පාලනය
පාලනමය ප්‍රතිපත්ති ක්‍රියාවලි

(iii) සහභාගිත්ව කළමනාකරණය
(iv) කළමනාකරණ පරිසරය
(v) සිද්ධි අධ්‍යයනය

මෙය ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

**11.** විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝණය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. මෙම නිවේදනයේ රෙගුලාසිවලට අනුව කිසියම් අයදුම්කරුවෙකු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන විට හෝ විභාගයෙන් පසුව කුමන හෝ අවස්ථාවක සුදුසුකම් නොමැති අයෙකු බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේ දී ම අවලංගු කරනු ලැබේ.

**12.** මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද උතුරු පළාත් රාජ්‍ය සේවයේ නිලධරයෙකු සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

**13.** යම් තනතුරක පුරප්පාඩු පිරවීමේදී, එම පුරප්පාඩු අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් පිරවීම පිළිබඳ අවසාන තීරණය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් ගනු ලබනු ඇත.

**14.** මෙම නිවේදනයේ සිංහල, දෙමළ භාෂා අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට දෙමළ මාධ්‍ය නිවේදනය බලපැවැත්වෙන්නේ ය.

**15.** මෙම චක්‍රලේඛයේ අඩංගු තොරතුරු ඔබගේ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව හෝ කාර්යාලය යටතේ සේවය කරන අදාළ නිලධාරීන්ගේ අවධානයට යොමු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

**16.** තවද, මෙම තොරතුරු www.np.gov.lk ⟶ **Exams and Recruitments** ⟶ **Advertisement** ⟶ **2026** උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

**"මෙම චක්‍රලේඛය රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද, 2026.06.26 දිනැති අංක 2,495 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනයට අනුකූලව නිකුත් කරනු ලැබේ."**

**ආල්වාප්පිල්ලෙ සිරි**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
**2026.08.25**

**පිටපත්:-**

01. ප්‍රධාන ලේකම්, උතුරු පළාත - කා.දැ.පි
02. ආණ්ඩුකාරවර ලේකම්, උතුරු පළාත - කා.දැ.පි